# සද්ධර්මාලංකාරය මගින් හෙළිවන ලක්දිව ඓතිහාසික තොරතුරු පිළිබඳ විමසුමක්

කරුණාරත්න ඩී.ජී.අයි.එම්., කිරිඇල්ල කේ.ජී.සී.ඩී. සහ කිරිඇල්ල කේ.ජී.ටී.එස්.කේ.කේ.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
dgimadushani96@gmail.com

**සාරසංක්ෂේපය**

ධර්මකීර්ති මා හිමියන් විසින් රචිත සද්ධර්මලංකාරය බෞද්ධාගමික පාඨකයන් ඉලක්කකර ගනිමින් රට වැසියා ආගම දහම කෙරෙහි ආශක්ත කරවීම උන්වහන්සේගේ ඒකායන අරමුණයි. අපගේ පර්යේෂණයේ අරමුණ වන්නේද සද්ධර්මාලංකාරයෙන් හෙළිවන ඓතිහාසික ජන සමාජය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමයි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ එකල ජන සමාජය සංවිධානය වී තිබුණේ කෙසේදැයි අධ්‍යයනය කිරීමයි. අපගේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස පුස්තකාල අධ්‍යයනය යොදාගනිමින් තොරතුරු විමර්ශනයට ලක් කරයි. මුදලෙහි ප්‍රාථමික අවධිය වන්නේ භාණ්ඩ හුවමාරුවයි. එය පැරණි ලංකාවේ ජනයා අතර පැවති බවට සාලි රාජ කතා වස්තුව මනාව සාක්ෂි දරයි. කර්මාරතිස්සයන්ට කර්මාන්ත මිල සඳහා ලැබුණේ ඌරු මාංශයයි. "එක් දවසක් වැද්දෙක් ඌරෙකු මරා ගෙනවුත් මෙම ඌරු මාංශය කර්මාන්ත මිල පිණිස දෙමියි, තිස්සයන්ට දින" ඒ තුළින් එකල කම්හල් කර්මාන්තය පැවතියා සේම වැසියා යකඩ ඇසුරින් නිෂ්පාදනයන් සිදු කළ බව පැහැදිලි වේ. පැරණි සමාජයේ පැවති ජීවන මාර්ගයෙහි යථා ස්වභාවය කෙසේද? යන්න ඉන් ප්‍රකට වේ. ආරඤ්ඤක අභය ස්ථවිර කතා වස්තුවට අනුව "හරන්තික නම් සොරෙක් රාත්‍රී භාගයෙහි ගොස් දන්දුන් පිළි රැගෙන එති."හරන්තික සාහසික දරුණු මංකොල්ලකරුවකු නො වුවද භික්ෂූන්ගේ සිවුරු සොරකම් කළේ පැවති ආර්ථික දරිද්‍රතාවය නිසාය. සංස්කෘතික තොරතුරු පිරික්සා බැලීමේදී එකල සමාජය තුළ කුලභේදය ක්‍රියාත්මක වූ අයුරු අශෝකමාලා චරිතයෙන් ගම්‍යමාන වේ. ඇය සැඩොල් කුලයේ තරුණියක් වූ අතර සැඩොල් කුලය සමාජයේ පිළිනොගත් බවද සැඩොල් කුලයේ පිරිස් සමාජයේ අන්ත අසරණ තත්ත්වයට පත් වූ අයුරු දක්නට ලැබේ. ආරඤ්ඤක කතා වස්තුවේ උපාසක හරන්තිකට ලබා දෙන දඬුවම එකල සංස්කෘතියේ ප්‍රතිබිම්බයකි. ඔහු අමු සොහොනකට ගෙනයයි.ඒ තුළින් එකල මළ සිරුරු වෙනුවෙන් පැවති ක්‍රියාදාමය පිළිබඳව අවබෝධයක් ලද හැකිය. මීට අමතරව අද්භූත බලවේග කෙරෙහි තිබූ විශ්වාසය, ගව මස් කෑමේ සම්ප්‍රදායද පැවත ඇත. මේ තුළින් නිගමනය කළ හැක්කේ එකල සමාජ සංවිධානය ඉතා ප්‍රාථමික අවධියක තිබූ බව හා නොදියුණු සංස්කෘතියක් ලෙස සමාජය ක්‍රියාත්මක වූ බවයි.

**ප්‍රමුඛ පදඃ** *ලක්දිව ඓතිහාසික තොරතුරු, සාලි රාජ කතා වස්තුව, ආරඤ්ඤක අභය කතා වස්තුව, පැරණි සමාජය*